# මන්දාරම් නුවර

**මන්දාරම් නුවර සංචාරය සඳහා උපදෙස්**

අප සංචාරයේ අරමුණ: මන්දාරම් නුවර දැක බලාගැනීම, ජයාරූප ගැනීම

දිනය : 2013 අගෝස්තු 10

සහභාගී වූවන් ගණන: 4

ගමන් කල ආකාරය: මිතුරකුගේ කාර් රථයකින්, ත්‍රී රෝද රථයකින්, පා ගමනින්, ආපසු පැමිණීම බස් රථයකින්

විශේෂ ස්තූතිය: ලසිත රත්නායක (සිතීයම සැකසීම, ප්‍රවාහන පහසුකම්)

ජයාරූප අනුග්‍රහය: නිශාන් කුළසිංහ, අරුණ සුගතපාල, ලසිත රත්නායක, මුදිත රූබසිංහ

මෙම වාර්තාව සැකසූයේ: නිශාන් කුළසිංහ විසිනි.

**මන්දාරම් නුවරට පිවිසිය හැකි ගමන් මාර්ග කිහිපයක්**

**මහනුවර සිට**

මහනුවර > තැන්නේ කුඹුර > ගුරුදෙණිය > හාරගම > කන්දේ හන්දිය > හගුරන්කෙත > රිකිල්ලගස්කඩ > පදියපැලැල්ල > මන්දාරම් නුවර - 58km

මහනුවර > තැන්නේ කුඹුර > ගුරුදෙණිය > හාරගම > අධිකාරිගම > කීර්තිබණ්ඩාර පුර > නාරන්තලාව > පදියපැලැල්ල > මන්දාරම් නුවර - 79km

www.LakViskam.org

මහනුවර > තැන්නේ කුඹුර > ගුරුදෙණිය > හාරගම > අධිකාරිගම > ලැමසූරිය > රිකිල්ලගස්කඩ > පදියපැලැල්ල > මන්දාරම් නුවර - 82km

මහනුවර > ගෙලිඔය > ගලහ > හේවාහැට > පොරමඩුල්ල > රිකිල්ලගස්කඩ > පදියපැලැල්ල > මන්දාරම් නුවර - 99.2km

**නුවරඑළිය සිට**

නුවරඑළිය > හාවාඑළිය > කඳපොළ (නුවරඑළිය උඩ පුස්සැල්ලාව පාර ඔස්සේ) > බ්‍රූක්සයිඩ් > මතුරට - හයි-ෆොරස්ට් පාර > මන්දාරම් නුවර - 40km




www.LakViskam.org

මහනුවර, හගුරන්කෙත, රිකිල්ලගස්කඩ, මන්දාරම් නුවර මාර්ගය

**පරිසරය පිළිබඳව**

කඳුකර, ශීත දේශගුණය සහිතයි. මීදුමෙන් වැසී යන හදිසි වර්ෂා ඇද හැලෙන ප්‍රදේශයකි. මේ නිසාම කූඩැල්ලන්, ජල පහරවල්, ඝන වනාන්තර, ප්‍රදේශයේ බහුල වේ. දිවියන්, වල් ඌරන්, ගෝනුන්, මී මැස්සන් ආදී අනතුරුදායක සතුන් වනාන්තර ප්‍රදේශයේ ගැවසිය හැක. නාය යාමේ අවදානමක් සහිතය, කළුගල් ලිස්සන සුළුය, ගල් පෙරලී යා හැක. ඒවායින් තුවාල සිදු විය හැක. මේ සියලු පරිසර තත්ත්ව වලට පෙර සූදානමක් ඇතිව ඇඳුම් බෙහෙත් ආදිය රැගෙන එහි යන්නේ නම් මැනවි.

**මන්දාරම් නුවර**

මන්දාරම් නුවර යනු හගුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි ඉතාමත් සශ්‍රික රමණීය ගම්මානයකි. එය රිකිල්ලගස්කඩ ප්‍රදේශයට ආසන්නයෙන් පිහිටා ඇත.




මීදුමින් වලාකුලින් වටවූ මන්දාරම් නුවර

මන්දාරම් නුවර නාමයෙන් කියවෙන්නාක් පරිද්දෙන්ම මන්දාරම් ස්වභාවයක් මෙම ගම්මානය පුරා දක්නට ඇත. පිදුරුතලාගල , කබරගල ආදී  කඳු පන්ති වලින් වටවීම හා වලාකුළු, මීදුම් සහිත ස්වභාවය නිසා දළ වශයෙන් දිනකට පැය දෙකක් පමණ සූර්යාලෝකය මද වශයෙන් ලැබේ. ඉතිරි පැය දහසයක්ම පාහේ සූර්යාලෝකය නොමැතිව මන්දාරම් ස්වභාවයෙන්, කළුවරින්ගෙවී යයි.




www.LakViskam.org

ඈතින් පෙනෙන සමාධි බුද්ධ ප්‍රතිමාව හා බෝධිය

ගමට පිවිසෙන විට ඈතින් දිස්වෙන ශ්‍රී රාජගිරි විහාරයේ එළිමහන් සමාධි බුද්ධ ප්‍රතිමාවත් ගම මධ්‍යයේ පිහිටි බෝගස, වගාබිම්, කඩ පේලිය හා ගැමියන්ගේ අව්‍යාජ සිනහව ගමේ ඇති සරල බවත් ආගමට ලැදි බවත් කදිමට විදහාපායි. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් ඉතා කුළුපගව කතා බහ කිරීමටත් අන්‍යයන්ට උදව් කිරීමටත් කැමැත්තක් දක්වති. රටේ සංවර්ධන කටයුතු නිසා ගම්මානවල යටිතල පහසුකම් වැඩි දියුණු වීම තුලින් කෙමෙන් කෙමෙන් නාගරීකරණය වීමේ ලක්ෂණ මෙම ගම්මානයෙන්ද දක්නට ලැබේ.



දිය පාරවල් හා අත්හැර දැමූ තේ කම්හල

මන්දාරම් නුවරට පිදුරුතලාගල කඳුවැටිය හොඳින් දර්ශනය වේ. ගම්මානය පිහිටා ඇත්තේ මෙම පිදුරුතලාගල කඳු පාමුල ප්‍රදේශයේය. කඳු, වනාන්තර වලින් වටවී ඇති නිසා මෙම ගම්මානයට ජලයෙන් කිසිදු අඩුවක් නොමැත. මාර්ග දෙපසින් පවා දිය පහරවල් නිරතුරු ගලා යනු දක්නට ලැබේ. මේ හේතුව නිසා ගම්මානය අවට දිය ඇලි කිහිපයක් දැකිය හැක. කබරගල ඇල්ල, කළු පාලමේ ඇල්ල, ඇතිනිවල ඇල්ල, කොලපොතන ඇල්ල මෙයින් කිහිපයකි. ගම්මානයට ආසන්න එළමුල්ල ප්‍රදේශයේ කබරගල ආශ්‍රිතව සුළු පරිමාණ ජලවිදුලි බලාගාරයකි. පිදුරුතලාගල සිට ආරම්භ වන බෙලිඋල් ඔයේ අතු ශාඛාවන් (මෙය හෝර්ටන් තැන්නේ සිට ගලන බෙලිහුල් ඔය නොවේ) ගම්මානය ඔස්සේ ගලා ගොස් ලැමසූරිය ගම්මානය හරහා රන්දෙනිගල ජලාශයට එකතු වේ.

www.LakViskam.org

ගම්මුන්ගේ ප්‍රධානතම ජීවිකාව එළවලු වගාවයි. ගම්මානය පුරා සරුසාර එළවලු ආදී වගා බිම් දැකිය හැක. ගැමියන් සාමුහිකව එකිනෙකාගේ වගා බිම් වල කටයුතු වලට සහය වෙති. ඔවුන් තම ගෙදරට එන නෑදෑ හිතවතුන්ට පවා ආපසු ගෙන යාමට ලබා දෙන්නේ එළවළු ආදියයි.

පිදුරුතලාගල කඳු දෙසට වන්නට ගම්මානයේ කෙළවරක අත්හැර දැමූ තේ කම්හලක් පිහිටා ඇත. මෙම කම්හල කලක් පාසල් ගොඩනැගිල්ලක් ලෙස භාවිතා කර ඇත. මන්දාරම් නුවර රජයේ බෙහෙත් ශාලාවක් හා මාතෘ රෝහලක් පිහිටුවා ඇත. එමෙන්ම ගොවි අලෙවිසලක්ද හා මෑතකදී ආරම්භ කල පොලිස් මුරපලක්ද මාර්ගය අයිනේ දක්නට ඇත. මන්දාරම් නුවර අසිරිය වඩාත් හොඳින් අත්විඳගැනීමට නම් දෙසැම්බර්, ජනවාරි මාස වලින් පසු එහි යාම වඩාත් උචිත වේ.

**පිදුරුතලාගල අධිආරක්ෂිත කලාපය**

පිදුරුතලාගල ආශ්‍රිත වනාන්තරය දැඩි ආරක්ෂිත කලාපයකි. වර්තමානයේදී රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලිඛිත අවසරයකින් හා ප්‍රදේශයේ පොලිස් මුර පොළ දැනුවත් කිරීමෙන් තොරව එයට ඇතුළු වීම සපුරා තහනම් වේ. එසේ ඇතුල් වුවහොත් එය ඉතා අනතුරුදායක ක්‍රියාවක් බව සිහි තබා ගන්න. මෙම තහනමට ප්‍රධාන වශයෙන් හේතු වන්නේ පිදුරුතලාගල කඳු මුදුනේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ත්‍රිමාණ රාඩාර් පද්ධතිය පිහිටා තිබීමත්, ප්‍රධාන සන්නිවේදන හා රූපවාහිනී ප්‍රති විකාශනණ මධ්‍යස්ථාන පිහිටා තිබීමත් වේ.






පොලිස් මුරපොල හා පිදුරුතලාගල කඳු

ලිඛිත අවසරයක් සහිතව වුවද වනාන්තරයට ඇතුල් වන්නේ නම් ගම්මානයෙන් මග පෙන්වන්නකු රැගෙන යාම ඉතා වැදගත් වේ. මන්දයත් වනාන්තරය තුල මංමුලා වීමට ඇති හැකියාව ඉතා ඉහල නිසාය. ප්‍රමුඛතම ජංගම දුරකථන ජාල වල සංඥා දුර්වල මට්ටමක පවතී.

**ප්‍රවාහන පහසුකම්**

මන්දාරම් නුවර ගම්මානයට පිවිසීමට බස්රථ සේවයක් ඇත. ඉන් එක් බසයක් මහනුවර සිට පදියපැලැල්ල හරහා මන්දාරම් නුවර දක්වා ධාවනය කරයි. මන්දාරම් නුවර සිට පදියපැලැල්ල දක්වා පමණක් ධාවනය වන බස් රථ කිහිපයක්ද ඇත. කෙසේ වෙතත් මෙම බස් ධාවනය වන්නේ "යලට -මහට" මෙන්ය. එනම් පැය කිහිපයකට වරක්ය.

www.LakViskam.org






මන්දාරම් නුවර බස් රථයක් හා මීදුමෙන් වැසුනු පිදුරුතලාගල කඳු පංතිය

බස් සේවයට අමතරව ත්‍රීරෝද රථයකින් ගම්මානයට පිවිසිය හැක. නමුත් එහි අවාසිය නම් බොහෝවිට ඔවුන් අධික මුදලක් අය කිරීමයි. මන්දාරම් නුවර දක්වා ඇති මාර්ගය ඉතා වංගු සහිත පටු මාර්ගයකි. කඳු හෙල් ගිරි දුර්ග මැදින් යන බස් ගමන විටෙක බිය උපදවයි. ඊට හේතුව ප්‍රපාතය හා බොහෝ ස්ථාන වල සාමාන්‍ය ප්‍රමාණයේ වාහන දෙකක් මාරු වීමට පවා නොහැකි තරමට මාර්ගය පටු වීමය. කෙසේ වෙතත් එළමුල්ල හන්දියේ සිට මාර්ගය කාපට් අතුරා හොඳ තත්වයෙන් ඇත. වර්තමාන දේශපාලන බලවතකුගේ මහ ගෙවල් මන්දාරම් නුවර ප්‍රදේශයේ පිහිටා තිබීම මාර්ගය කාපට් කිරීමට හේතුව බව ගම්මුන්ගේ අදහසයි.




www.LakViskam.org

රිකිල්ලගස්කඩ සිට අපගේ ගමන් මග

**නවාතැන් පහසුකම්**

කඳු තරනය සඳහා පැමිණෙන පිරිස් බොහෝ විට ගැමියන් සමග කතා බහ කර ඔවුන්ගේ නිවාස වල නැවතීම හෝ පොදු ස්ථානයක ප්‍රධානීන් සමග සාකච්ජා කර රැය ගතකිරීමට අවසර ලබා ගැනීම සිදු වේ. මන්දාරම් නුවර ආසන්නයෙන් ඇති එළමුල්ල ප්‍රදේශයේ "එළමුල්ල එකෝ බංගලාව" (Elamulla Eco Bungalow) නවාතැන් ගැනීමට පහසුකම් සහිත ස්ථානයකි. මෙයට අමතරව නේවාසික පහසුකම් සපයන වෙනත් ස්ථාන ඇත්තේ අල්ප වශයෙනි. ගැමියන් සමග කතා බහ කොට සුදුසු ස්ථානයක ඔබ විසින් ගෙනයන කූඩාරමක් වුවද අටවා ගැනීමට හැකි වනු ඇත. ගම්මානයේ ඇත්තේ සුළු පරිමාණයෙන් පවත්වාගෙන යන කුඩා කඩ කිහිපයක් පමණි. අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ මිලදී ගැනීමට ස්ථාන එහි නොමැත. ඔබ ගැමි නිවාසයක නතර වුවහොත් ඔවුන්ගේ සහයෝගයෙන් අලුත් එළවලු සමහ ගමේ ආරට අහාර වේලක් සකස් කර ගැනීමට හැකි වනු ඇත. බොහෝමයක් පැරණි ගැමියන් මුදල් බලාපොරොත්තුවෙන් මෙවන් උපකාර නොකරයි. එහෙත් ඔවුන්ට සාධාරණ මුදලකින් හෝ ප්‍රතිසංග්‍රහ කිරීමට ඔබත් කාරුණික වන්න.





වගා බිම්

www.LakViskam.org

**මේගැනත් සිතන්න**

ඔබ මෙම ප්‍රදේශයට යාමට අදහස් කරන්නේ නම්, ඔබ ඇතුළු පිරිස එසේ යන්නේ කුමක් සඳහාදැයි හොඳින් අවබෝධ කරගන්න. හුදු විනෝදය සඳහා පමණක් එහි යන්නේ නම් මෙම පරිසර පද්ධතිය ඔබ ඇතුළු සියලු ජීවී ප්‍රජාවගේත් උරුමයක් නිසා එය ආරක්ෂා කර ගත යුතු බවට නිරතුරු සිහි තබා ගන්න. වෙනත් කටයුත්තක් සඳහා එහි ගියද පරිසරය ආරක්ෂා වන අයුරින් කටයුතු කරන්න. මෙය ජල පෝෂක ප්‍රදේශයකි. ඔබ එහි ගෙන යන ප්ලාස්ටික් ඇතුළු සියලු අපද්‍රව්‍ය එම ප්‍රදේශයේ බැහැර නොකර ආපසු ගෙනවිත් නිසි ස්ථානයකදී පමණක් බැහැර කරන්න. ඔබ මත්පැන් පානය කර මෙම ප්‍රදේශ වල සංචාරය කිරීමෙන් වලකින්න. එය ඔබගේත් පරිසරයේත් එහි වෙසෙන සමස්ථ ජීවී ප්‍රජාවගේත් යහපතට ඉවහල් වේ. ජලය හැර පරිසර පද්ධතියෙන් කිසිවක් ලබා නොගන්න. මේ පරිසර පද්ධතිය සියලු ජීවී ප්‍රජාවගේය. එම නිසාවෙන් එම පරසරය සුරකින්න. අපෙන් පසුවට එන ජීවී ප්‍රජාවටත් එය ආරක්ෂා කර තබන්න.

තවත් ජයාරූප එකතුවක් මෙතනින් නරබන්න

https://picasaweb.google.com/102500057347588371605/MandaramNuwara2013?noredirect=1

මෙම වාර්තාවේ අයිතිය “ලක් විස්කම්” වෙබ් අඩවිය සතුය. © www.lakviskam.org

lakviskam@gmail.com